# 2026 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විදුහල්පති විසින් නිර්දේශ ලබා දීම

**විදුහල්පති විසින් නිර්දේශ ලබා දීමේ දී පහත පියවරයන් අනුගමනය කළ යුතු ය.**

1. www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ පිවිස `Login as a principal` යන්න තෝරන්න.
2. දැනටමත් ඔබ වෙත යොමු කර ඇති user name හා pass word නිවැරදිව ඇතුළත් කර `Sign in` හරහා පද්ධතියට පිවිසෙන්න.
3. ඔබගේ පාසලෙන් වැටුප් ලබන 2026 වාර්ෂික ගුරු ස්ථාන මාරු අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදයට යොමු කළ ගුරුවරුන්ගේ ලේඛනය තිරයේ දිස් වේ. 2026.12.31 දිනට ඔබ පාසලේ සේවා කාලය අවුරුදු 08 සම්පූර්ණ කර ඇති වයස අවුරුදු 55 ට අඩු සියලුම ගුරුවරුන්ගේ නම් තිබේදැයි පරික්ෂා කරන්න. අනිවාර්ය ස්ථාන මාරුවට අයත් වන එම කාණ්ඩයේ ගුරුවරුන් අයදුම්පත් යොමු නොකර තිබේ නම් අදාළ ගුරුවරුන්ට ලිඛිතව දැනුම් දී අයදුම්පත් යොමු කරන ලෙස දැනුවත් කරන්න.
4. එම ලේඛනය තුළ ඔබ පාසලෙන් වැටුප් නොලබන ගුරුවරුන් සිටී නම් ඒ පිළිබඳ ව 011-2075854 අංකයට දැනුම් දිය යුතු ය.
5. ගුරුවරයාගේ නම ඉදිරියෙන් option යටතේ icon 3ක් දිස් වේ.
   - 5.1. පළමු icon එක මගින් අදාළ ගුරුවරයාගේ අයදුම්පත පරික්ෂා කළ හැක.
   - 5.2. දෙවන icon එක මගින් අයදුම්පත නිර්දේශ කිරීම සඳහා පිවිසිය හැක.
   - 5.3. තෙවන icon එක මගින් විදුහල්පති නිර්දේශ කළ පසු නිර්දේශ සහිත පිටුව බාගත කර ගත හැක.
6. ඉහත සඳහන් කළ දෙවන icon එක මගින් පිවිසුනු පසු අනු අංක 01, 02, 03 යටතේ අනුපිළිවෙලින් අදාළ ගුරුවරයාගේ ජාතික හැඳුනුම්පත් අංකය, නම හා වර්තමාන පාසල දිස් වේ.
7. අංශය ප්‍රාථමික නම් 2026 නව අධ්‍යයන වර්ෂයේ ඉගැන්වීම් කරන ශ්‍රේණිය නිවැරදි ව තෝරන්න
8. අයදුම්පත් යොමු කරන ලද ගුරුවරයා එම විෂය සඳහා පාසලට අතිරික්ත වන්නේ නම් Yes Icon එක තෝරන්න.
9. ගුරුවරයා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් හෝ පැවැත්වෙමින් පවතී නම් අයදුම්පතේ අනු අංක 08 ප්‍රශ්නය සඳහා yes තෝරන්න.
10. ගුරුවරයාගේ ස්ථාන මාරුව සඳහා සලකා බැලිය යුතු විශේෂ රෝගී තත්ත්වයන් හෝ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටී නම්, අනු අංක 09 යටතේ yes තෝරන්න.

    10.1 අයදුම්පතේ අනු අංක 09 සඳහා yes තෝරන්නේ නම් specify the disease සඳහා අදාළ හේතුව තෝරන්න.

11. අයදුම්පතේ අනු අංක 10 යටතේ ගුරුවරයා ස්ථාන මාරුව සඳහා නිදහස් කිරීම පිළිබඳ නිර්දේශ ලබා දිය හැක.

    11.1 අනුප්‍රාප්තිකයකු සහිත ව නිදහස් කිරීමට නම් Recommended with successor යන්න තෝරන්න.

    11.2 අනුප්‍රාප්තිකයකු රහිත ව නිදහස් කිරීමට නම් Recommended without successor යන්න තෝරන්න.

12. අයදුම්පතේ අනු අංක 11 යටතේ ගුරුවරයා පිළිබඳ සඳහන් කළ යුතු විශේෂ කරුණක් ඇත්නම් එය සඳහන් කරන්න.

13. ඇතුළත් කළ සියලු තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර [Save] මත click කරන්න.

14. සියලු ගුරුවරුන්ගේ නිර්දේශ කිරීම් අවසන් වූ පසු ඉහත අංක 5.3 හි සඳහන් කළ icon එක මගින් එම එක් එක් ගුරුවරයාගේ ස්ථාන මාරු අයදුම්පත සඳහා විදුහල්පති නිර්දේශ සහිත පිටුව බාගත කර මුද්‍රණය කර ගත හැක.

15. විදුහල්පති නිර්දේශ සහිත ආකෘතියේ මුද්‍රිත පිටපතෙහි විදුහල්පති විසින් තම අත්සන, දිනය හා නිල මුද්‍රාව තැබිය යුතු ය. ගුරුවරයා විසින් විදුහල්පති වෙත ඉදිරිපත් කර ඇති ස්ථාන මාරු අයදුම්පතේ අවසාන පිටුව ලෙස ඔබ ඉහත අංක 15 යටතේ වූ උපදෙස් පරිදි මුද්‍රණය කර ගත් පිටුව ඇමිණිය යුතු ය.

16. ගුරුවරයා අයදුම්පත සමඟ ඉදිරිපත් කරන අනෙකුත් අතිරේක ලේඛන විදුහල්පති නිර්දේශ පත්‍රිකාවට පසුව ඇමිණිය යුතු ය.

17. සියලු ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබා දී අවසන් වූ පසු, ඔබ පාසලේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ සියලු ගුරුවරුන්ගේ ලේඛනය (TTB/2026/01) තිරයේ ඉහළින් දිස් වන [Download transfer request list] මගින් බාගත කර මුද්‍රණය කර ගත යුතු ය.
18. එම මුද්‍රිත ලේඛනයේ විදුහල්පති අත්සන, දිනය හා නිල මුද්‍රාව යෙදිය යුතු ය.
19. එම ලිපි ලේඛන විෂය හා මාධ්‍යය අනුව වෙන් කරන්න.

19.1 අදාළ ලේඛන ලිපිකවරවල බහා පහත ආකෘතිය පරිදි ලේබල සකස් කර තොරතුරු සටහන් කරන්න

**National School Teacher Transfer 2026**

Province -
School Name -
School Census No. -
Subject -
Medium -

**No. of Applications -**

19.2 එම ලේබලය ලිපි කවරවල මතුපිට අලවා භාර දිය යුතුය.

20. අයදුම්පත පිරවීමේ දී ඉහත කරුණුවලට අමතරව යම් තාක්ෂණික ගැටළුවක් පවතී නම් 011- 2075854 හෝ 011-2784434 දුරකථන අංකවලට රාජකාරී කාලය තුළ දැනුම් දිය හැක.

ජ්.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් (ආයතන )
ලේකම් වෙනුවට